

# පරිසර හිතැති "Bio Mass"

**"බයෝ මාස්" (Bio Mass) යනු, කාබනික සම්භවයක් සහිත විවිධ වර්ගයේ අඟුරු ද්‍රව්‍ය හඳුන්වා දීමට අප යොදාගන්නා ව්‍යවහාරික යෙදුමය.**

මින් ඇතැම් ද්‍රව්‍ය, පිදුරු, දහයියා වැනි කෘෂි ක්ෂේත්‍රයේ අපද්‍රව්‍ය ය. සෙසු ද්‍රව්‍ය ලෙස කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය හා වනාන්තර ආශ්‍රිතව හමුවන වියළි උක් රොඩු හා ලී කුඩු වැනි දේ හඳුන්වා දිය හැකිය.

මෙවැනි සෑම ද්‍රව්‍යයකට ම, අත්‍යවශ්‍ය වූ ලක්ෂණ තිබේ. නැවත නැවතත් අලුත් කළ හැකි ප්‍රභවයකින් ලබාගත යුතු වීමත්, ශක්ති උත්පාදන ප්‍රභවයක් ලෙස භාවිත කිරීමේ දී පිටවන කාබන් ප්‍රතිශතය ශූන්‍ය වීමෙන් පෘථිවිතලය උණුසුම් වීමේ ගැටලුවට දායක නොවීමත් යන්න, මෙහිදී අත්‍යවශ්‍ය සාධක කොට සැලකේ.

වන ආවරණයට හානි නොවන සේ, පාරිසරික සමතුලිතතාව රැකෙන පරිදි හොඳ තත්ත්වයේ අඟුරු ද්‍රව්‍ය (Bio Mass) ලබා ගැනීමට, "ඉන්ධන - දැව වගා ව්‍යාපෘතිය" සාර්ථකම ක්‍රමය ලෙස හඳුන්වා දිය හැකිය.

1 වගුව

| මූලද්‍රව්‍යය | සංකේතය | වියළි අළු මුක්ත බර (% ලෙස) |
|---|---|---|
| කාබන් | C | 44-51 |
| හයිඩ්‍රජන් | H | 5.5-6.7 |
| ඔක්සිජන් | o | 41-50 |
| නයිට්‍රජන් | N | 0.12-0.60 |
| සල්ෆර් | S | 0.01 |

සෑම අඟුරු ද්‍රව්‍යයකටම තාප ජනක අගය, ස්කන්ධය සහ වියළිබව, අළුමුක්ත බව යන්න පදනම් කොට ගණනය කළ විට 4500 K Cal / Kg වේ (කි. ග්‍රෑමයට, කි. කැලරි 4500)

භාවිත අවස්ථාව අනුව, තෙතමනය හා ඝනත්වය මත එම අගය විවිධාකාරයෙන් අඩුවීමට ද පුළුවන. මෙහිදී, තෙතමනය 20% ක්ව පවතිද්දී, නැවත නැවතත් අලුත් කළ හැකි දැව අඟුරුවලින් (Bio Mass) ලබාගත හැකි ශක්තිය ප්‍රයෝජනවත් දර්ශකයකි.

ඍජු දහනයෙන් 3500 K Cal / Kg

ගෑස් බවට හැරවීමෙන් 2500 K Cal / Kg

"Bio Mass" ලෙස කෙළින්ම ප්‍රයෝජනයට ගත හැකි ප්‍රභව ශ්‍රී ලංකාව තුළ හඳුනාගෙන තිබේ. ඒවායෙන් සමහරක් වාර්ෂිකව පරිභෝජනය කෙරෙන අයුරු.

දහයියා (1997 අගය) - ටොන් 450,000

පිදුරු (1998 අගය) -- ටොන් 2,690,000

ලී මෝල් කර්මාන්තයේ ලීකුඩු සහ අතිරික්ත කැබලි කොටස් - ටොන් 100,000

රබර් වගාවන්ගෙන් ලබා ගන්නා දර (Bio Mass) මෙහි ඇතුළත් නොවුනද බොහෝ කර්මාන්ත, බේකරි සහ ගෘහස්ථ ප්‍රයෝජනය සඳහා රබර් දර භාවිත වේ. සෙසු ප්‍රභවයන් වනාන්තර හා පොල්වතු ආශ්‍රයෙන් ලබා ගැනේ.

දර, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ශක්ති ප්‍රභවයයි. අදටත් භාවිත සියලු ශක්ති පරිභෝජන ක්‍රම අතරින් 60% දක්වා සැපයෙනුයේ මේ මඟිනි.

වගා කටයුතු සහ නැවත නැවතත් අලුත් කළ දැව Bio Mass තාප සහ විද්‍යුත් ශක්තිය බවට පරිවර්තනය සඳහා වඩාත් සුදුසු වූ ද කාර්යක්ෂම වූ ද තාක්ෂණය භාවිතයෙන් විධිමත් සහ ස්ථායි වෙළෙඳපොළක් ගොඩනගා ගැනීම තුළින් බලශක්ති අංශය කෙරෙහි දායකත්වය ඉහළ නංවාගත හැකිව තිබේ.

ඒ අනුව දැනට ලබාගත හැකි "Bio Mass" ප්‍රභව වෙනුවට, කෙටි කලකින් භාවිතයට ගත හැකි ග්ලිරිසීඩියා වැනි ශාක කෙරෙහි වැඩි අවධානය යොමු වී ඇත.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ හා පොල් පර්යේෂණායතනය එකතුව කළ වැඩසටහනකින් සහතික කර ඇත්තේ මෙහිලා ග්ලිරිසීඩියා ශාකය බොහෝ ශක්‍ය හා වඩාත් ගැලපෙන ශාකයක් බවයි. ශක්ති ප්‍රභවයක් ලෙස, මෙය විවිධාකාරයෙන් වගා කළ හැකිය.

* සාම්ප්‍රදායිකව වැටවල් සඳහා යොදගනී
* පොල් වගාවක යටි වගාවක් ලෙස
* ගම්මිරිස් වගාවක ආධාරක ලෙස
* DENDRO වගාවන් සඳහා

මෙහිදී අක්කරයට පැළ 2000 ක් වන පරිදි සිටුවිය හැකිය.

මේ අනුව සලකා බැලීමේ දී වෙනත් සැලකිය යුතු ප්‍රයෝජනයක් නොගන්නා මුත් ඉන්ධන දැවයක් (නැවත නැවතත් අලුත් කළ හැකි "Bio Mass" එකක්) ලෙස ග්ලිරිසීඩියා ශාකය අපට නිධානයකි.